SEASL

# ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පුවත් හසුන අංක 04

ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ නව ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය මඟිනි (SEASL). තවද මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්ත කළමණාකරණය කරන සහ නීති ක්‍රියාත්මක කරන රජයේ ආයතන, මුහුදු ආහාර අපනයනය සඳහා අනුග්‍රහය දක්වන රජයේ ආයතන, මෙන්ම කහ වරල් කෙලවල්ලන් , ඇස්ගෙඩි කෙලවල්ලන් සහ සප්පරා මත්ස්‍ය අස්වැන්න ලබාගන්නා මරුවල් පන්න බෝට්ටු අයිතිකරුවන්ගේ සංගමයද ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය සමඟ එකට එක්වී කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වන්නේ කහ වරල් කෙලවල්ලන් , ඇස්ගෙඩි කෙලවල්ලන් සහ සප්පරා මසුන්ගේ ජෛව විද්‍යාත්මක මට්ටම සහ පැවැත්ම මෙන්ම ඔවුන් ජීවත්වන පරිසරයේ විවිධත්වය , ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වයට හානි නොවන පරිදි ධීවර කර්මාන්තය සිදුකරගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකිරීමයි. තවද ජාතික හා අන්තර්ජතික නීති ක්‍රියාත්මක කිරීමේදී ධීවර කර්මාන්තය මඟින් ඇතිවන බලපෑම අවම කිරීම මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වේ. මෙම ව්‍යාපෘතියේ දීර්ඝ කාලීන ඉලක්කය වන්නේ සමාජීය වගකීම් හා සමානාත්මතාවයන්ට අනුකූල අන්තර්ජාතික නීති සහ ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර සැපයුම්දාමයේ සමානාත්මතාවයන්ට අනුකූලව ධීවර කර්මාන්තය මඟින් ඇතිවන වර්තමාන හා අනාගත ආර්ථික හා සාමාජීය විකල්ප හා ප්‍රතිලාභ නඩත්තු කිරීමයි. ඒ අනුව නව මරුවල් පන්න ධීවර ව්‍යාපෘතියේ සාමාජිකයන් විසින් පසුගිය මාස 6 තුල ගන්නා ලද ක්‍රියාමාර්ගවල විස්තරයක් මෙම පුවත් හසුන අංක 04 මඟින් දැක්වේ.

***පහත දැක්වෙන සංවිධාන, නියෝජිතයන් සහ අපනයනකරුවන් ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීමේ නව ව්‍යාපෘතියේ සාමාජිකත්වය දරයි.***

Longline Boat Owners' Associations

GLOBAL SEAFOODS [PVT] LTD

## ධීවර කර්මාන්තයේ ජෛව විද්‍යාත්මක තත්වය වැඩි දියුණු කිරීම

### ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ / ඉන්දියන් සාගර ටූනා කොමිසමේ අනු ව්‍යාපෘතීන් - ඉන්දියන් සාගර ටූනා කොමිසමේ ගිවිසුමට අදාළ පාර්ශවයන්


ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ ජාතික ජලජ සම්පත් පයේෂණ හා සංවර්ධන ආයතනයේ (NARA) හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක්වී ඉන්දියන් සාගර ටූනා කොමිසමෙහි (IOTC) සඳහන් මත්ස්‍ය තොගයේ ජෛව විවිධත්වය ඉතා ඉහල මට්ටමක පවත්වා ගැනීම යටතේ ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන ඒම සඳහා 2019 වර්ෂයේ මුල භාගයේදී කටයුතු සිදු කරන ලදී. ධීවර දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනයේ නිලධාරීන් මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ නියෝජිතයන්ද සමඟ මාර්තු මාසයේ සීෂෙල්ස් හි පවත්වන ලද කරුණු වෙන්කර දැක්වීම පිළිබඳ පස්වන තාක්ෂණික කමිටුවට සහ ඉදිරිපත් කිරීමේ විවේචනය පිළිබඳ 2 වන තාක්ෂණික කමිටුව මෙන්ම ජුනි මස ඉන්දියාවේ පැවැත්වූ කළමණාකරණ සැකසුම් පිළිබඳ තෙවන තාක්ෂණික කමිටුවටත් සහභාගී වන ලදී. මෙම කමිටු වාර්තාවන්ගේ පිටපත් IOTC වෙබ් අඩවියෙන් ලබාගත හැක.

### මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ / නාරා ආයතනයේ ධීවර සංවර්ධන අනු ව්‍යාපෘතීන් - මත්ස්‍ය තොග ගණනය කිරීමේ සම්මත සහ සම්මත නොවන ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය කිරීම



ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් සහ ධීවර කළමණාකරුවන් සඳහා ඉන්දියන් සාගර ටූනා කොමිසම මඟින් මත්ස්‍ය තොග ගණනය කිරීම සඳහා යොදගන්නා ක්‍රම සහ අස්වනු ලබාගැනීමේ ක්‍රමෝපායන් පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අනු ව්‍යාපෘතියක් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය විසින් මාර්තු මාසයේදී පවත්වන ලදී. මෙම නව අනු ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර සපයනු ලැබුවේ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ ඒකාබද්ධ නියෝජිතයන් මඟිනි. ටෝකියෝහි සාගර විද්‍යා හා තාක්ෂන විශ්ව විද්‍යාලයේ , සාගර ජීව විද්‍යා අංශයේ මහාචාර්ය ආචාර්ය ටොෂිඩේ කිටකාඩෝ විසින් මෙම තෙදින වැඩමුළුව නාරා ආයතනයේදී පවත්වන ලදී. ඔහු ඉන්දියන් සාගර ටූනා කොමිසමේ ක්‍රමෝපායන් පිළිබඳ අංශයේ සභාපති ධූරය දරයි. මෙම වැඩමුළුව මඟින් මත්ස්‍ය තොග ගණනය සඳහා වූ සිද්ධාන්තික දැනුමත් දත්ත මෙයෙවීම සහ ගණනය

කිරීම සඳහා වූ ප්‍රායෝගික දැනුමත් ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන මත්ස්‍ය වර්ග 3 කට අදාල දත්ත අවම ධීවර කර්මාන්තයන්ගේ තොග ගණනය කිරීමේ ආදේශක ක්‍රම සඳහා විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීමට ධීවර සංවර්ධන ව්‍යාපෘතියට උපකාරී වනු ඇත.




දත්ත අවම ක්‍රමය යොදා ගනිමින් කහවරල් කෙලවල්ලන්, ඇස්ගෙඩි කෙලවල්ලන් සහ සප්පරා මත්ස්‍යයන්ගේ මත්ස්‍ය තොගය ගණනය කිරීම සඳහා විද්‍යාත්මක දත්ත එක් රැස් කිරීම මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. ජූනි මස අග වන විට කහ වරල් කෙලවල්ලන් 2272 කගේ ඇස්ගෙඩි කෙලවල්ලන් 48 කගේ සහ සප්පරා මසුන් 1604 කගේ දිග, ලිංග බේදය සහ බර යන දත්ත එක් රැස් කරන ලදී. මරුවල් පන්න ධීවර සංවර්ධන ව්‍යාපෘතියට අදාල ඒකාබද්ධ සාමාජිකයන් 7න් 5ම මේ සඳහා තම නිධාරීන්ගේ සහය ලබාදෙන ලදී. දත්ත අවම ධීවර කාර්මාන්ත සඳහා ආදේශක ක්‍රම මගින් තොගය ගණනය සඳහා දත්ත එක් රැස් කිරීම සහ දත්ත ගණනය කිරීම මිලග කාර්තුවේදී ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් අවසන් කිරීමට නියමිතය..

## ධීවර කර්මාන්තය ආශ්‍රිත පාරිසරික තත්වය වැඩි දියුණු කිරීම.

### බ්ලූ රෙසෝස් ට්‍රස්ට් (BRT) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) අතර අනු ව්‍යාපෘතිය - මෝරුන් සඳහා වූ ශ්‍රී ලංකා ජාතික සැලැස්ම - 2018 - 2022

2019 වර්ෂයේ මුල් භාගයේදී ධීවර දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය වැඩමුළු 5 ක් පවත්වන ලදී. මෙම වැඩමුළු වලදී ධීවර දෙපාර්තමේන්තුවේ හා නාරා ආයතනයේ නිලධාරීන් එක්ව මෝරුන් සංරක්ෂණය සහ කළමණාකරනය සඳහා වූ ජාතික සැලැස්ම පිළිබඳව සාකච්ඡා කරන ලදී. (2018-2022) මේ සඳහා මෝර මසුන් අල්ලනු ලබන ධීවරයන් සහ ධීවර දෙපාර්තමේන්තුව නිලධාරීන් 200 ට වඩා සහභාගී විය. වැඩමුළු අවසානයේ 2018 - 2022 සඳහා වූ එම ජාතික සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කළ යුතු බව නිගමනය විය. මෙම අනු ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය ආධාර සැපයුයේ BRT ආයතනය සහ පිව් චැරිටිබල් ට්‍රස්ට් ආයතනය මගිනි. එම ව්‍යාපෘතිය 2019 ජූනි මස 30 වන දිනෙන් අවසන් විය.



## ධීවර කර්මාන්තයේ කළමණාකරනය වැඩි දියුණු කිරීම


### සීපැක්ට්/ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අතර අනු ව්‍යාපෘතිය - දේශීය නිරීක්ෂක වැඩසටහන

ඉන්දියන් සාගර ටූනා කොමිසමේ සඳහන් නීති අංක 11/04 ට අනුව තම සාමාජික රටවල් 24m වඩා අඩු යාත්‍රා යොදා ගනිමින් අන්තර් ජාතික මුහුදේ ටූනා සහ ටූනා වැනි මත්ස්‍යයන් අල්ලනු ලබන්නේ නම්, එම රටවල් විසින් මෙහෙයුම් සිදුකරන මුළු බෝට්ටු වලින් 5% වත් මෙහෙයුම් හා විද්‍යාත්මක දත්ත එක් රැස් කළ යුතුවේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින බහු දින යාත්‍රා ගණන 1350 වන අතර ඒවා ප්‍රමාණයෙන් ඉතා කුඩා වේ. (සාමාන්‍ය දිග - 12.4m) එම නිසා එම බෝට්ටු වල මෙහෙයුම් නිරීක්ෂණයට අතිරේක පුද්ගලයෙක් යෙදීම අසීරු කාර්‍යයකි. එම නිසා අන්තරජාතික මුහුදේ මෙහෙයුම් සිදු කරන එක බෝට්ටුවකින් වත් දත්ත එක් රැස් කිරීමට ශ්‍රී ලංකාව අසමත් වී ඇත.



මේ අතර සොබාදහම සඳහා ලෝක ව්‍යාප්ත අරමුදලේ (WWF) වෙනුවෙන් ආචාර්ය, මෝසම් ඛාන් විසින්, පාකිස්ථානයේ (WWF) මගින් ක්‍රියාත්මක කරන ලද ගැණියන් යොදා ගන්නා නිරීක්ෂණ වැඩසටහනක් පිළිබඳව 2017 වර්ෂයේදී ධීවර දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. WWF හි එම ක්‍රමය ආකෘතියක් ලෙස යොදාගනිමින් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් සරළ, අඩු වියදම්, දත්ත එක් රැස් කිරීමේ ක්‍රමයක් ගොඩ නගන ලදී. එම ක්‍රමය දැනට පවතින ලෝග් පොතේ දත්ත, සම්මුඛ සාකච්ඡා මගින් ධීවරයන්ගෙන් ලබා ගන්නා දත්ත, සහ මත්ස්‍ය විශේෂය, දිග, බර සඳහන් ඉලෙක්ට්‍රොනික දත්ත වල එකතුවකි. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය ආධාර ලබා දෙන්නේ සී පැක්ට් මගිනි. සී පැක්ට් යනු, ලෝක ආහාර සැපයුම් දමයේ සාමාජික, ආර්ථික සහ පාරිසරක වගකීම සංවර්ධනය සඳහා කැපවී සිටින ප්‍රධාන පෙලේ උතුරු ඇමරිකානු මුහුදු ආහාර සමාගම් වල එකතුවකි.

නොවැම්බර් 5ත් ජනවාරි 17ත් අතර ඉලෙක්ට්‍රොනික ටැබ්ලට් 18 සහ කැමරා 2ක් උපයෝගි කර ගනිමින් ස්කිපර්වරු 20ක් විසින් එක් රැස් කරන ලද ස්වාධීන විද්‍යාත්මක දත්ත හලාවත සහ මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් කොළඹ ධීවර දෙපාර්තමෙන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය වෙත ලබා දෙන ලදී. තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා පෙලාජ්කෝස් පුද්ගලික ආයතනයේ පර්යේෂනයන් වෙත ලබා දෙන ලදී. ඒ අනුව ඉන්දියන් සාගර ටූනා කොමිසමේ නිර්දේශ වලට අනුව 24m ට වඩා අඩු, අන්තර් ජාතික මුහුදේ මසුන් අල්ලන ශ්‍රී ලංකාවේ බහු දින යාත්‍රා වල විද්‍යාත්මක දත්ත එක් රැස් කිරීමට මෙම ක්‍රමය යොදා ගත හැකි බව සනාථ කිරීමට දේශීය නිරීක්ෂක ව්‍යාපෘතියේ නියමු වැඩසටහනෙහි ප්‍රතිඵල සමත් විය.




ධීවර දෙපාර්තමේන්තුවට අවශ්‍ය දත්ත ඒකක 33ක් දේශීය නිරීක්ෂක වැඩසටහන මගින් එක් රැස් කිරීමට සමත් විය. ඒවා නම් චාරිකා පිළිබඳ දත්ත, සැකසුම් දත්ත සහ ඉලක්ක ගත හා ඉලක්කගත නොවන මසුන්ගේ විද්‍යාත්මක දත්ත වේ.එක් එක් මරුවල් පන්න සැකසුමට අදල IOTC මඟින් නිර්දේශ කරන ලද , චාරිකා හා පන්නවලට අදල දත්ත 80% ට වඩා මෙමඟින් ලබාගැනීමට ධීවර දෙපාර්තමේන්තුව සමත් විය. නමුත් මුළු අස්වැන්න සඳහා විද්‍යාත්මක දත්ත ලබාදීමට මෙම ක්‍රමය අසමත්විය.



නියමු ව්‍යාපෘතියේදී ධීවරයන් විසින් නිරීක්ෂණය කොට තිබුණේ මුළු මත්ස්‍ය අස්වැන්නෙන් 30% පමණි. නිරීක්ෂණය කරන ලද මත්ස්‍යයන්ගේ 40% ලිංග භේදය පිළිබඳ දත්තද 100% කගේ දේශීය නම , ඉංග්‍රීසි නම , IOTC කේතය සඳහන් දත්ත ලබාගන්නා ලදී. නිරීක්ෂණය කරන ලද මත්ස්‍යයන්ගෙන් 97% කගේ බර දත්තද 75%කගේ ස්ථානය ,දිනය සහ වේලාව පිළිබඳ දත්ත සඳහන් වී ඇත. මෙම දේශීය නිරීක්ෂණ ව්‍යාපෘතිය මඟින් ධීවර දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඉලක්කගත නොවන මසුන්ගේද, අන්තරායට තර්ජනයට හා ආරක්ෂා කරන ලද මසුන්ගේද විද්‍යාත්මක තොරතුරු ලබාගත හැක.



සියලුම සාමාජිකයන්ගේ අදහස වූයේ IOTC නිර්දේශවලට අනුකූල ටූනා සහ ටූනා වැනි මත්ස්‍යයින් ඇල්ලීමේ ධීවර කර්මාන්තයට අදල දත්ත සමඟ 100% ගැලපෙන අයුරින් මෙම ව්‍යාපෘතිය දියුණු කළ යුතු බවයි. ඒ සඳහා අවශ්‍ය නිර්දේශයන් කොළඹ ධීවර දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ධීවර කාර්යාලවල නිලධාරීන් , යාත්‍රා හිමිකරුවන් සහ ස්කිපර්වරුන් සමඟ සාකච්ජා කරන ලදී. එම නිර්දේශයන් සහිත ව්‍යාපෘතියේ දෙවන පියවර මාර්තු මාසයේදී ආරම්භ වේ. එම දෙවන පියවර සඳහා යාත්‍රා 15ක් ඇතුලත්වන අතර ජූලි මසදී අවසන් වීමට නියමිතය. ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතිය අගෝස්තුමස තෙක් දීර්ඝ කරනු ඇත.




ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ඒකකය සහ හයිනේට්ස් පුද්ගලික සමාගම එක් වී නිර්මාණය කරන ලද ඉලෙක්ට්‍රොනික ලොග් පොත ජූනි මාසයෙදී නිපදවා අවසන් වනු ඇත. මෙම නවතම මෘදුකාංගය මගින් දැනට ලොග් පොත භාවිතා කර එක්රැස් කරගන්නා චාරිකා දත්ත සහ අස්වැන්න පිළිබඳ දත්ත එක්රැස් කිරීමට බලාපොරොත්තු වේ. මෙම ඉලෙක්ට්‍රොනික ලොග් පොත නිර්මාණයට සහ නිපදවීමට මූල්‍ය අධාර දෙනු ලබන්නේද සී පැක්ට් ආයතනය මඟිනි.

## ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශය / ඉන්දියන් සාගර ටූනා කොමිසම අතර අනු ව්‍යාපෘතිය - ඉන්දියන් සාගර ටූනා කොමිසමේ ගිවිසුම සමඟ අදාල පාර්ශවයන්ගේ එකඟත්වය

පෙබරවාරි මාසයේ ටොසැම්බික් හි පවත්වන ලද අධීක්ෂණය , පාලනය සහ අත්පත්කරගැනීම සහ ලබාගන්නා අස්වනු පිළිබඳ ලිපි ලේඛන පිළිබඳ ඉන්දියන් සාගර ටූනා කොමිසම මඟින් පවත්වන ලද සමුළුවට ධීවර දෙපාර්තමේන්තුවේ සමාජයින් සහභාගී විය. තවද එම නිලධාරීන් ජුනි මස ඉන්දියාවේ පවත්වන ලද 16 වන එකඟත කමිටුවටත් 23 වන සැසියටත් සහභාගි විය. මෙම සමුළුවට හා කමිටුවට සම්බන්ධ තොරතුරු IOTC වෙබ් අඩවිය මගින් ලබාගත හැක.

## සමාජීය වගකීම සහ ආර්ථික සමානාත්මතාව දියුණු කිරීම

### ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අනු ව්‍යාපෘතිය - ශ්‍රී ලංකා මුහුදු ආහාර අනන්‍ය ලෙස වර්ග කිරීම

ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර සඳහා අනන්‍යතාවයක් ලබා දීමට කටයුතු කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් මැයි මසයේ කමිටුවක් පත්කර ඇත. මෙම අනන්‍යතාවය ඇති කිරීම මඟින් ශ්‍රී ලංකාවේ උසස් තත්වයේ මුහුදු ආහාර නිෂ්පාදනවලට ලෝකයේ ඇති ඉහලම ඉල්ලුමත් , මුහුදු ආහාර විකිණීමේදී අවශ්‍ය වන කරුණක් විදහා දක්වනු ඇත.

## ශ්‍රීලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ තත්වය පැහැදීම

### ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය / NESI අතර ව්‍යාපෘතිය - MSC අනුමත පූර්ව තක්සේරුව

2018 වර්ෂයේ කැප් මැරීන් ආයතනය මගින් කරන ලද පූර්ව තක්සේරුවට අනුව මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ ප්‍රධාන ඉලක්කගත විශේෂ 3 අයත් ධීවර කර්මාන්තයට MSC ප්‍රමිතීන්ට අනුව සාමාන්‍ය සාමාර්ථයක් ලැබී ඇත. නමුත් එම (SG > 0.60) පූර්ව තක්සේරුවට අනුව නිර්දේශයන් 2 ක් හේතුවෙන් සම්පූර්ණ ධීවර කර්මාන්ත 3ම අසමත් වී ඇත. මෙම තක්සේරුව සඳහා මූල්‍යාධාර සපයන්නේ නිව් ඉන්ග්ලන්ඩ් මුහුදු ආහාර සමාගමයි.

| නිර්දේශිත අගය | ≥80 | 60-79 | <60 | Overall |
|---|---|---|---|---|
| කහ වරල් කෙලවල්ලන් | 12 | 14 | 02 | 0.68 |
| ඇස්ගෙඩි කෙලවල්ලන් | 12 | 13 | 02 | 0.69 |
| සප්පරා | 12 | 13 | 02 | 0.69 |




### මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ (SEASL) අනු ව්‍යාපෘතිය - fisheryprogress.org.

fisheryprogress.org. ආකෘතියට අනුව ශ්‍රී ලංකාවේ මරුවල් පන්න ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සංකීර්ණ එකකි. මන්දයත් එමගින් ධීවර තත්ව වලට අදාල නිර්දේශ 28 පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ ආකෘති පත්‍රය ජුනි මස යාවත්කාලීන කරනු ලබයි. fisheryprogress.org. මගින් මෙම ධීවර සංවර්ධන ව්‍යාපෘතිය (C) එනම් සාමාන්‍ය දියුණුවක් සහිත කාණ්ඩය යටතේ වර්ග කරනු ලබයි. ඉහත කී පරිදි 2018 වන විටදී නිර්දේශ 2ක් රතු වර්ණයද (7%) , 93% කොළ සහ කහ වර්ණයද 17% සැලසුම් සම්පූර්ණ කිරීමට යටත් වී ඇත. ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ වැඩි දියුණුව සඳහා පහත කාර්යන්ට මූල්‍යමය ආධාර අවශ්‍ය වේ.

1) සියළුම දිස්ත්‍රික් ධීවර කාර්යාල 6 ආවරණය වන පරිදි 24m ට වඩා අඩු යාත්‍රාවල දේශීය නිරීක්ෂක ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
2) ධීවර කර්මාන්තයේ අස්වැන්න පාලන කිරීම සඳහා නීති සහ ක්‍රම හඳුන්වා දීම.
3) 24m ට වඩා වැඩි බෝට්ටුවල ජාතික නිරීක්ෂක වැඩසටහන වැඩිදියුණු කිරීම.
4) 2018-2022 සඳහා ජාතික සැලැස්මෙහි නීති විරෝධී , වාර්තා නොවන හා පාලනය නොකල ධීවර කටයුතු IUU සඳහා වූ කොටස යාවත්කාලීන කිරීම.
5) අන්තරායට ලක් වූ තර්ජනයට ලක්වූ සහ ආරක්ෂා කල යුතු විශේෂ මිය යාමට පෙර නැවත නිදහස් කිරීමේ ක්‍රම හඳුන්වා දීම.

පහත සඳහන් මුහුදු ආහාර නිෂ්පාදන සමාගම් මරුවල්පන්න ධීවර සංවර්ධන ව්‍යාපෘතියට දායකත්වය දක්වයි.

GLOBAL SEAFOODS [PVT] LTD

*ශ්‍රීලංකාවේ දැල්පන්න ධීවර කර්මාන්ත වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ පුවත් හසුන් වල මෑඳ පිටපත් සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලබා ගත හැක.*

*මෙම දැල්පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර මෙම විද්‍යුත් තැපැල් ලිපිනයෙන් විමසන්න.steve@pelagikos.lk*